සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 81 - කෘෂි හා ආහාර තාක්ෂණය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු ප්‍රදානය කිරීම පිළිබඳ සාරාංශය

## I ප්‍රශ්න පත්‍රය

බහුවරණ 1 - 40 = 1 x 40 40 = 40

## II ප්‍රශ්න පත්‍රය

**1 ප්‍රශ්නය (අනිවාර්ය)**

1 - 10 දක්වා = 2 x 10 20 = 20

**2 ප්‍රශ්නය** ( 2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

i කොටස ලකුණු 3
ii කොටස ලකුණු 4
iii කොටස ලකුණු 3 = 10

**3 ප්‍රශ්නය**

i කොටස ලකුණු 4
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 3 = 10

**4 ප්‍රශ්නය**

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 4
iii කොටස ලකුණු 4 = 10

**5 ප්‍රශ්නය**

i කොටස ලකුණු 4
ii කොටස ලකුණු 2
iii කොටස ලකුණු 4 = 10

**6 ප්‍රශ්නය**

i කොටස ලකුණු 6
ii කොටස ලකුණු 2
iii කොටස ලකුණු 2 = 10

**7 ප්‍රශ්නය**

i කොටස ලකුණු 4
ii කොටස ලකුණු 2
iii කොටස ලකුණු 4 = 10

මුළු ලකුණු = 100

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහසායි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **81**

විෂයය / பாடம்: **කෘෂි හා ආහාර තාක්ෂණය**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 | 31. | 2 |
| 02. | 4 | 12. | 2 | 22. | 3 | 32. | 4 |
| 03. | 1 | 13. | 2 | 23. | 2 | 33. | 2 |
| 04. | 1 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 1 | 35. | 1 |
| 06. | 2 | 16. | All | 26. | 2 | 36. | 1 |
| 07. | 1 | 17. | 4 | 27. | 4 | 37. | 3 |
| 08. | 2 | 18. | 1 | 28. | 3 | 38. | 3 |
| 09. | 4 | 19. | 3 | 29. | 2 | 39. | 2 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 81 - කෘෂි හා ආහාර තාක්ෂණය

### කෘෂි හා ආහාර තාක්ෂණය II

※ පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. පාසල් ප්‍රදර්ශනයකට සූදානම් වන සිසු පිරිසක් විවිධ බෝග වගා ආදර්ශනය කිරීම, තවාන් සහ කොම්පෝස්ට් සැකසීම සහ කෘෂිකර්මයට සම්බන්ධ විවිධ ආකෘති නිර්මාණයට සූදානම් වූහ.
   - (i) මෙම ප්‍රදර්ශනය සඳහා ආදර්ශනය කළ හැකි තවාන් වර්ග **හතරක්** සඳහන් කරන්න.
   - (ii) උස් බිම් බෝග සඳහා තවාන් මිශ්‍රණය සැකසීමට අවශ්‍ය අමුද්‍රව්‍ය නම් කර නියමිත අනුපාත සඳහන් කරන්න.
   - (iii) එළවළු තවාන්වලට බහුලව වැළඳෙන රෝගයක් සඳහන් කර, එම රෝගයට හේතු වන රෝගකාරකය සඳහන් කරන්න.
   - (iv) (a) ප්‍රදර්ශනයේදී ආදර්ශනය කළ හැකි කොම්පෝස්ට් සැකසීමේ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
     (b) පසට කොම්පෝස්ට් එකතු කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.
   - (v) නිර්පාංශු වගා ක්‍රම ආදර්ශනයේදී ඒ සඳහා යොදා ගත හැකි රෝපණ මාධ්‍ය **දෙකක්** සහ බහුලව භාවිත කරනු ලබන පෝෂණ මාධ්‍යයක් සඳහන් කරන්න.
   - (vi) ප්‍රදර්ශනය සඳහා සැකසිය හැකි රසායනික නොවන පළිබෝධනාශක **හතරක්** සඳහන් කරන්න.
   - (vii) (a) ප්‍රදර්ශන භූමියේ අලංකරණය පිණිස සකසා ඇති තෘණ භූමිය සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය කුමක් ද?
     (b) ජලය සමග පොහොර යෙදිය හැකි සූක්ෂ්ම ජල සම්පාදන ක්‍රමයක් ආදර්ශනය කිරීම සඳහා පොලිතීන් මලුවල වගාකර ඇති මිරිස් වගාවකට සුදුසු ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න.
   - (viii) වැවක ආකෘතියක් නිර්මාණය කිරීමේදී ඊට ඇතුළත් කළ යුතු අංග **හතරක්** සඳහන් කරන්න.
   - (ix) ගව නිවාස ආකෘති සැකසීමේදී ඊට ඇතුළත් කළ යුතු ප්‍රධාන අංග **හතරක්** සඳහන් කරන්න.
   - (x) නවසින් ගැට ගසා තබන ක්‍රමය අනුව සැකසිය හැකි ගව නිවාස ආකාර **දෙක** ලියන්න.

1.

(I). උස් වූ තවාන්, ගිල් වූ තවාන්, නොරිදෝකෝ තවාන් (කුට්ටි තවාන්), බඳුන් තවාන්, තැටි තවාන්, මඩ තවාන්, ඩැපොග් තවාන්

**(ලකුණු 1/2 X 4 = ලකුණු 2)**

(II). මතුපිට පස් : කාබනික පොහොර (ගොම හෝ කොම්පෝස්ට්)
අනුපාතය 1 : 1

**අමුද්‍රව්‍යවලට = ලකුණු 01**
**අනුපාතයට = ලකුණු 01**

(III).

| **රෝගය** | | **රෝග කාරකය** |
|---|---|---|
| දිය මලන්කෑම | - | දිලීර |
| හිටු මැරීම | - | බැක්ටීරියා |

**රෝගය නම් කිරීමට = ලකුණු 01**
**රෝගකාරකය = ලකුණු 01**

(IV).

(a) ගොඩ ක්‍රමය, වළ ක්‍රමය, කෝටු රාමු ක්‍රමය, බැරල් ක්‍රමය

**(ලකුණු 1/2 X 1 = ලකුණු 01)**

(b)
- ශාක පෝෂණයට අවශ්‍ය සියලුම පෝෂ්‍ය පදාර්ථ අඩංගු වීම
- දිගු කාලයක් තිස්සේ අඩු වේගයකින් පෝෂක නිදහස් කිරීම
- පාංශු ව්‍යුහය හා ජල අවශෝෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම
- පසේ ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩි කිරීම
- කැටායන හුවමාරු ධාරිතාව වැඩි කිරීම
- ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කිරීම / පසේ $P^H$ අගය නොවෙනස්ව තබා ගැනීම

**(ලකුණු 1/2 X 2 = ලකුණු 01)**

(V). **රෝපණ මාධ්‍ය**

- කොහු බත්
- බොරලු
- කුඩා ගල් පතුරු
- දහයියා - දහයියා අඟුරු
- කොකෝ පීට්
- වර්මිකියුලයිට්
- ග්ලාස් වූල්
- වැලි
- ගල් කුඩු
- පීට් මෝස්
- කොහු කෙඳි
- පර්ලයිට්
- රොක් වූල්

**(ලකුණු 1/2 X 2 = ලකුණු 01)**

**පෝෂණ මාධ්‍ය**

- ඇල්බට් මිශ්‍රණය
- ඇලන් කූපර් මිශ්‍රණය

**(ලකුණු 01)**

(VI).

- කොච්චි සාරය
- දුම්කොළ තැම්බූ වතුර
- අරලිය මල් තැම්බූ වතුර
- කනේරු ඇට හා ගව මූත්‍ර දියරය
- පැපොල් සාරය
- සුදු ළූනු සාරය
- භූමිතෙල් හා සබන් දියර මිශ්‍රණය
- කොහොඹ ඇට සාරය
- වල් සූරියකාන්ත කොළ සාරය

**(ලකුණු 1/2 X 4 = ලකුණු 02)**

(VII). (a). ඉසින / විසිරි ජල සම්පාදනය (ස්ප්‍රින්ක්ලර් ජල සම්පාදනය)

**(ලකුණු 01)**

(b). බිංදු ජල සම්පාදනය

**(ලකුණු 01)**

(VIII). වැව් බැම්ම, සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන, රළපනාව, වැව් ඉස්මත්ත

**(ලකුණු 1/2 X 4 = ලකුණු 02)**

(IX).

- ආහාර සැපයීම සඳහා ස්ථානයක්
- ජලය සැපයීමට ස්ථානයක්
- සතුන්ට වැතිර සිටීමට ස්ථානයක්
- ගොම හා මූත්‍ර ඉවත් කිරීමට කාණුවක්
- පැටවුන් තැබීමට සුදුසු ස්ථානයක්
- නැම්බියන් සඳහා සුදුසු ස්ථානයක්
- වහළක්
- සතුන් වෙන් කරන වැට
- ආහාර වැට
- ප්‍රසූත කොටුවක්
- පැටවුන් සඳහා කොටු

**(ලකුණු 1/2 X 4 = ලකුණු 02)**

(X).

- හිසට හිස ක්‍රමය
- වලිගයට වලිගය ක්‍රමය

(ලකුණු 1 X 2 = ලකුණු 02)

**2.** බෝග වගාවෙන් ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීම සඳහා දේශගුණික සාධකවල බලපෑම අධ්‍යයනය කිරීම වැදගත් වේ.

(i) (a) ශ්‍රී ලංකාව ප්‍රධාන කෘෂි දේශගුණික කලාප කීයකට බෙදා තිබේ ද?

(b) එසේ කලාපවලට බෙදීමට පදනම් වූ සාධක **දෙක** සඳහන් කරන්න.

(ii) (a) යම් ප්‍රදේශයක පරිසර උෂ්ණත්වය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න.

(b) බෝග වගාවේදී උෂ්ණත්වයේ හිතකර බලපෑම් **හතරක්** ලියන්න.

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමවල පොදු අරමුණු **තුනක්** සඳහන් කරන්න.

2.

(I). (a). 7 කට

(ලකුණු 01)

(b). වර්ෂාපතනය
උච්චත්වය

(ලකුණු 1 X 2 = ලකුණු 02)

(II). (a).

- සමකයේ සිට ඇති දුර
- මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
- උච්චත්වය (උන්නතාංශය)
- වන ගහනය
- අභ්‍යන්තර ජලාශ පිහිටා තිබීම
- මිනිස් ක්‍රියාකාරකම්

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(b).

- ප්‍රභාසංස්ලේෂණ ශීඝ්‍රතාව වැඩිවීමට
- බීජ ප්‍රරෝහණය සඳහා
- දඬු කැබලි මුල් ඇද්දවීම
- අල බෝගවල ආකන්ධ ඇති වීම
- උත්ස්වේදන ශීඝ්‍රතාව වැඩි කිරීම සඳහා
- සෞම්‍ය කලාපික බෝගවල පුෂ්ප පිපීම
- පාංශු ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වයට

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(III).

- කෘෂි නිෂ්පාදන වැඩි කිරීම
- ජල විදුලිය නිපදවීම
- රැකියා නියුක්තිය
- ජල ගැලීම් පාලනය
- විද්‍යානුකූලව වගා කිරීමෙන් පරිසරය ආරක්ෂා කිරීම
- ජනගහන ප්‍රතිව්‍යාප්තිය සිදු කිරීම

(ලකුණු 1 X 3 = ලකුණු 03)

**3.** ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා එක් පියවරක් ලෙස ආහාර පරිරක්ෂණය හඳුන්වා දිය හැක් ය.

(i) (a) පසු අස්වනු හානියට බලපාන පෙර අස්වනු සාධක **හතරක්** ලියන්න.

(b) බෝග අස්වනු ප්‍රවාහනයේදී දක්නට ලැබෙන දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ii) ආහාර පරිරක්ෂණ ක්‍රම **තුනක්** නිදසුන් සහිතව සඳහන් කරන්න.

(iii) (a) ආහාරවල අගය වැඩි කිරීමේ වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න.

(b) ආහාරවල අගය වැඩි කිරීමේ ක්‍රම **දෙකක්** ලියන්න.

(I). (a).

- සුදුසු බෝග තෝරා ගැනීම
- ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතය
- ජල සම්පාදනය
- පොහොර යෙදීම
- පළිබෝධ
- පාංශු සාධක
- කෘෂි රසායන භාවිතය
- කාලගුණික සාධක
- බෝග තඩත්තුව

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(b)

- එළවළු පලතුරු, ප්‍රමාණය ඉක්මවා පැටවීම නිසා ඒවා තැලීමට ලක්වීම
- නුසුදුසු වාහනවල ප්‍රවාහනය කිරීම
- නිවැරදිව පැටවීම හා බෑම සිදු නොකිරීම
- අපරික්ෂාකාරී රිය පැදවීම
- දුෂ්කර මාර්ගවල දිගු වේලාවක් ප්‍රවාහන කටයුතු සිදු කිරීම
- එකම වාහනයේ කෘෂි අස්වනු සහ වෙනත් (ගොඩනැගිලි තනන ද්‍රව්‍ය) සමඟ එකට ප්‍රවාහනය කිරීම
- ප්‍රවාහනය කරන අස්වනු මත මිනිසුන් යාම

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(II).

- වියළීම - වියළන ලද මිරිස්, හතු, එළවළු, පලතුරු, කරවල
- උෂ්ණත්ව පාලනය :
  - පැස්චරීකරණය - කිරි
  - ජීවානුහරණය - කිරි
  - ශීතනය - මස්, එළවළු
  - අධි ශීතනය - මස්, එළවළු
- සාන්ද්‍රීකරණය :
  - සීනි - ජෑම්
  - ලුණු - ලුණු දෙහි
- පැසවීම :
  - ලැක්ටික් අම්ලය - යෝගට්, චීස්, මුදවාපු කිරි
  - ඇසිටික් අම්ලය - විනාකිරි
  - මධ්‍යසාර පැසවීම - වයින්, බියර්, රා, පාන්
- දුම් ගැසීම - මාළු
  මස්
- පරිරක්ෂණ ද්‍රව්‍ය යෙදීම : පලතුරු බීම
  - ජෑම්
  - චීස්
  - සොසේජස්

ක්‍රම 03 ලකුණු 1/2 X 3 = 1 1/2
නිදසුන් 03 ලකුණු 1/2 X 3 = 1 1/2
(ලකුණු 03)

(III). (a).

- පෝෂක ඌනතා ඇතිවීම වැළැක්වීම
- ආහාරයේ ගුණාත්මක බව වැඩි කිරීම
- ආහාර සකස් කිරීමේ දී හානි වන පෝෂක නැවත ලබා දීම
- ආහාරයේ අඩංගු පෝෂක අවශෝෂණය කර ගැනීම පහසු වීම
- වෙළෙඳපොළ ඉල්ලුම වැඩි කිරීම

(ලකුණු 1 X2 = ලකුණු 02)

(b).

- සරු කිරීම
- ප්‍රබල කිරීම
- අවම සැකසීම

(ලකුණු 1/2 X 2 = ලකුණු 01)

**4.** ශාක ප්‍රචාරණයේදී බීජ මෙන්ම වර්ධක කොටස් ද යොදා ගැනේ.

(i) බීජ මගින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි **හතරක්** සඳහන් කරන්න.

(ii) අඹ ශාකයකට අංකුර බද්ධයක් සිදු කරන ආකාරය නම් කළ රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) (a) බෝග වගාවේදී පාලිත තත්ත්ව ලබා දීම සඳහා සකස් කරනු ලබන ස්ථිර වගා ව්‍යුහ **හතරක්** සඳහන් කරන්න.

(b) නිර්පාංශු වගාවේදී භාවිත කරන රෝපණ මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(I).

- එක් මව් ශාකයකින් රෝපණ ද්‍රව්‍ය ලෙස බීජ රාශියක් ලබා ගත හැකි වීම
- බීජ ගබඩා කිරීමට අවශ්‍ය ඉඩකඩ අඩු වීම
- ප්‍රවාහනය පහසු වීම
- වියළා ගත් බීජ දිගු කලක් ගබඩා කර තබා ගත හැකි වීම
- නව ප්‍රභේද ලබා ගත හැකි වීම
- දෙමුහුම් දිරිය සහිත ශාක ලබා ගත හැකි වීම

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(II).




1. ග්‍රාහක කඳේ කැපුම යොදා ඇති ආකාරය
2. වෙන් කර ගත් අනුජ කොටස
3. ග්‍රාහකයට අනුජය සම්බන්ධ කරන ආකාරය
4. බද්ධය අවසන් වූ පසු බද්ධ පටිවලින් වෙලා තිබෙන ආකාරය

රූපයට ලකුණු 1/2 X 4 = ලකුණු 02

විස්තරයට ලකුණු 1/2 X 4 = ලකුණු 02

(III). (a).

❖ ස්ථිර වගා ව්‍යුහ

- පොලිතීන් ගෘහ
- දැල් ගෘහ
- ලී පටි (ලැත්) ගෘහ
- වීදුරු ගෘහ
- හරිතාගාර

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(b). ❖ නිර්පාංශු වගාවේ දී භාවිත කරන රෝපණ මාධ්‍යක තිබිය යුතු ලක්ෂණ
- මනා වාතනයක් පැවතීම
- මනා ලෙස ජල වහනය සිදු වීම
- ජලය රඳවා ගැනීමේ හැකියාව තිබීම
- ස්වාරක්ෂක ගුණය පැවතීම
- පළිබෝධවලින් තොර වීම

(ලකුණු 1 X 4 = ලකුණු 02)

**5.** **පළිබෝධ පාලනය සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම යොදා ගැනීම වඩාත් යුදුසු වේ.**

**(i) (a) බෝග වගාවේදී අනුගමනය කරන ශෂ්‍ය විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රම හතරක් සඳහන් කරන්න.**

**(b) ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක තුන රෝග ත්‍රිකෝණයක් මගින් දැක්විය හැකිය. එම සාධක ලියන්න.**

**(ii) ස්පර්ශ වල්නාශක හා සංස්ථානික (පරිසර්පහ) වල්නාශක අතර වෙනස කෙටියෙන් ලියා දක්වන්න.**

**(iii) (a) අවුලකපෝරා කුරුම්ණියාගේ ජීවන චක්‍රයේ අවස්ථා පිළිවෙළින් දක්වන්න.**

**(b) එම කෘමියා හානි කරන්නේ කුමන කුලයේ බෝගවලට ද?**

**(c) එම හානිය පාලනය කරන ක්‍රම දෙකක් ලියන්න.**

(I). (a).
- නියමිත පරතරය අනුව වගා කිරීම
- මනා ලෙස බිම් සැකසීම
- ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය
- වසුන් යෙදීම
- ආවරණ බෝග වැවීම
- නිර්දේශිත පොහොර නිර්දේශික ප්‍රමාණයට යෙදීම
- රෝග පළිබෝධවලින් තොර රෝපණ ද්‍රව්‍ය භාවිතය
- මනා ලෙස ජල කළමනාකරණය
- රෝගී ශාක කොටස් හෝ රෝගී ඉපනැලි වගා බිමෙන් ඉවත් කර පුලුස්සා විනාශ කිරීම
- අවට පරිසරයේ තිබෙන ධාරක වල් පැළ විනාශ කිරීම

(ලකුණු 1/2 X 4 = ලකුණු 02)

(b).
- රෝග කාරකයා
- ධාරක ශාකය
- රෝග කාරකයාට හිතකර පරිසරය

**සාධක 3 ලියා ඇත්නම් - ලකුණු 02**
**සාධක 2ක් හෝ 1 ක් ලියා ඇත්නම් - ලකුණු 01**

(II).
- ස්පර්ශ වල්නාශක ස්පර්ශ වූ ස්ථානයේ ශාක පටක පමණක් විනාශ වේ.
- සංස්ථානික වල්නාශක ස්පර්ශ වූ ස්ථානය තුළින් වල්නාශකය වල් පැලෑටිය තුළට ඇතුළු වීමෙන් මුළු ශාකයම විනාශ වේ.

(ලකුණු 1 X 2 = ලකුණු 02)

(III). (a). බිත්තර, කීට, පිළා, සුහුඹුලා

(අවස්ථා 4 ට 1 / 2 X 4 = ලකුණු 02)

(b). කුකර්බිටේසියේ කුලය

(ලකුණු 01)

(c). • බිම් සැකසීමේ දී හොඳින් පස පෙරළීම
• පස ජීවාණුහරණය කිරීම
• සුහුඹුලන් අතංගුවකින් අල්ලා විනාශ කිරීම
• බෝග මාරුව
• කීට හා පිළා අවධි විනාශ වන ලෙස පැළ අවට පස බුරුල් කිරීම

**(1 / 2 X 2 = ලකුණු 01)**

| |
|---|
| **6.** බෝගවලින් අපේක්ෂිත අස්වනු ලබා ගැනීම සඳහා ඌනතාවකින් තොරව ශාක පෝෂක ලබා දිය යුතු වේ.<br>(i) (a) බෝග වර්ධනය සඳහා අවශ්‍ය මහා පෝෂක **දෙකක්** සහ ක්ෂුද්‍ර පෝෂක **දෙකක්** වෙන වෙනම සඳහන් කරන්න.<br>(b) පසට යොදන රසායනික පොහොර බෝග මගින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ඉහළ නැංවීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.<br>(ii) බහුවාර්ෂික බෝගවලට රොක් පොස්පේට් යෙදීම නිර්දේශ කළ ද වාර්ෂික බෝග සඳහා නිර්දේශ කරනුයේ ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) ය. මෙයට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.<br>(iii) ශාක වර්ධනයට පොස්පරස් පෝෂකයේ වැදගත්කම් **දෙකක්** සඳහන් කර පොස්පරස් ඌනතාවේදී ශාකවල දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. |

(I). (a). • මහා පෝෂක - C, H, O, N, P, K, Ca, Mg, S

**(1 / 2 X 2 = ලකුණු 01)**

• ක්ෂුද්‍ර පෝෂක - Zn, Cu, Mn, Mo, B, Fe, Cl, Ni

**(1 / 2 X 2 = ලකුණු 01)**

(b). • කුඩා ප්‍රමාණවලින් කිහිප වරක් යෙදීම
• පස සමඟ කවලම් කිරීම
• පොහොර යෙදීමට පෙර වල් පැළ ඉවත් කිරීම
• කාබනික පොහොර සමඟ යෙදීම
• පසේ තෙතමනය ඇති විට යෙදීම
• අධික වර්ෂා කාලයේ නොයෙදීම
• වගාවේ වර්ධන අවස්ථාවට සුදුසු පොහොර යෙදීම

**(ලකුණු 1 X 4 = ලකුණු 04)**

(II). • රොක් පොස්පේට්වලින් පසට පොස්පරස් නිදහස් වීම සෙමින් සිදුවේ. එබැවින් බහු වාර්ෂික බෝග සඳහා යොදා ගත හැකි අතර වාර්ෂික බෝග වලට එම පොස්පරස් ලබා ගැනීමට අවස්ථාවක් නොලැබේ.
• ත්‍රිත්ව සුපර් පොස්පේට්වලින් පොස්පරස් ඉක්මනින් නිදහස් වන බැවින් වාර්ෂික බෝග සඳහා යොදා ගත හැකි ය.

**(ලකුණු 1 X 2 = ලකුණු 02)**

(III). • ශාක වර්ධනයට පොස්පරස් පෝෂකයේ වැදගත්කම :
  ▪ මූල පද්ධතියේ වර්ධනයට වැදගත් වේ
  ▪ සෛල විභාජනයට
  ▪ ශාකය තුළ ශක්ති හුවමාරුවට

**(ලකුණු 1 /2 X 2 = ලකුණු 01)**

• පොස්පරස් ඌනතා ලක්ෂණ :
  ▪ ශාකයේ වර්ධනය බාල වීම
  ▪ පත්‍ර පහසුවෙන් හැළීම
  ▪ සමහර ශාකවල මේරූ පත්‍ර දම් පාට වීම
  ▪ මුල් සංඛ්‍යාව අඩු වීම

**(ලකුණු 1/2 X 2 = ලකුණු 01)**



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

7. මානව පෝෂණයේදී ආහාරයෙහි ප්‍රෝටීන අවශ්‍යතාව සපුරාලීමට සත්ත්ව නිෂ්පාදන වැදගත් වේ.

(i) (a) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති ශ්‍රී ලංකාවේ ගව පාලන කලාප **හතරක්** සඳහන් කරන්න.

(b) ඉන්දීය ගව වර්ග හා යුරෝපීය ගව වර්ග අතර ඇති වෙනස්කම් **හතරක්** සඳහන් කරන්න.

(ii) කුකුළු පාලනයේදී යොදා ගැනීමට සුදුසු අතුරණුවක තිබිය යුතු ලක්ෂණ **හතරක්** ලියන්න.

(iii) (a) සත්ත්ව පෝෂණයේදී භාවිත කරනු ලබන සාන්ද්‍ර ආහාර හා දළ ආහාර අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(b) සාන්ද්‍ර ආහාර හා දළ ආහාර සඳහා උදාහරණ **දෙක** බැගින් ලියන්න.

(I). (a).
- උඩරට කලාපය
- මැදරට කලාපය
- පහතරට තෙත් කලාපය
- පහතරට වියළි කලාපය
- පොල් ත්‍රිකෝණය
- යාපන අර්ධද්වීපය

**(ලකුණු 1 /2 X 4 = ලකුණු 02)**

(b).

| ඉන්දීය ගව වර්ගය | යුරෝපීය ගව වර්ගය |
|---|---|
| • ශරීරය සාපේක්ෂව කුඩාය. | • සාපේක්ෂව විශාලය. |
| • ශරීරය පිටුපස රවුම්ය. | • ශරීරය පිටුපස රවුම් නැත. |
| • මොල්ලිය මනාව වර්ධනය වී ඇත. | • මොල්ලිය වර්ධනය වී නැත. |
| • ස්වේද ග්‍රන්ථි වැඩිය. | • ස්වේද ග්‍රන්ථි අඩුය. |
| • සම ඇදෙන සුළුය. සෙලවේ. | • සම ශරීරයට තද වී ඇත. |
| • කිරි නිෂ්පාදනය අඩුය. | • කිරි නිෂ්පාදනය වැඩිය. |
| • තැල්ල හා පෙකනි පෙත්ත මනාව වර්ධනය වී ඇත. | • තැල්ල හා පෙකනි පෙත්ත මනාව වර්ධනය වී නැත. |
| • ලෝම කෙටිය. | • ලෝම දිගය. |

**(ලකුණු 1 /2 X 4 = ලකුණු 02)**

(II).
- පහසුවෙන් සොයා ගත හැකි ද්‍රව්‍යයක් වීම
- මිල අඩු වීම
- පහසුවෙන් ගිනි නොගන්නා ද්‍රව්‍යයක් වීම
- පාලනය පහසු හා දූවිල්ලෙන් තොර ද්‍රව්‍යයක් වීම
- කුකුළන් විසින් ආහාරයට නොගන්නා ද්‍රව්‍යයක් වීම
- ජලය පහසුවෙන් උරා ගන්නා ද්‍රව්‍යයක් වීම

**(ලකුණු 1 /2 X 4 = ලකුණු 02)**

(III). (a).

| සාන්ද්‍ර ආහාර | දළ ආහාර |
|---|---|
| • දළ තන්තු ප්‍රමාණය 18% ට වඩා අඩු ය. | • දළ තන්තු ප්‍රමාණය 18% ට වඩා වැඩි ය. |
| • අධික ප්‍රෝටීන ප්‍රමාණයක් සහිතය. | • සාපේක්ෂව ප්‍රෝටීන ප්‍රමාණය අඩු ය. |
| • අධික ශක්ති ප්‍රමාණයක් ඇත. | • සාපේක්ෂව ශක්ති ප්‍රමාණය අඩු ය. |
| • පහසුවෙන් ජීර්ණය වේ. | • ජීර්ණය අපහසු ය. |
| • එන්සයිම මඟින් ජීර්ණය සිදු වේ. | • ක්ෂුද්‍ර ජීවීන් මගින් ජීර්ණය සිදු වේ. |

**(ලකුණු 1 X 2 = ලකුණු 02)**

(b).
- සාන්ද්‍ර ආහාර - පුන්නාක්කු, බඩ ඉරිඟු, හාල් නිවුඩු, මොලෑසස්
- දළ ආහාර - තෘණ, වියළි තෘණ, රනිල, සයිලේජ්, අල වර්ග, ශාක අතු, පිදුරු, තේ මණ්ඩි, පොතු වර්ග, බෝග අවශේෂ

**(ලකුණු 1/2 X4 = ලකුණු 02)**



WWW.PastPapers.WiKi

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න